www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමාගේ ඇෆ්පාක් යුද්ධය පකිස්තානයේ ස්වැට් මිටියාවත ගිලගනී

## Obama's AfPak war engulfs Pakistan's Swat Valley

**ජේම්ස් කොගාන් විසිනි**

**2009 මැයි 23**

ඔබාමා පරිපාලනය, ඇෆ්ගනිස්තානයේ මිලිටරි වාඩි ලා ගැනීම, ඊනියා "ඇෆ්පාක් යුද්ධය" කරා පතුරුවාහැරීමේ ප්‍රතිඵලයක් ලෙස පකිස්තානයේ වයඹදිග දේශසීමා ප්‍රදේශවල මානුෂීය ව්‍යසනයක් සිදුවෙමින් තිබේ.

පසුගිය වසර පුරා වයඹදිග දේශසීමා පලාත්වල සහ මධ්‍යම රජය මගින් පාලිත ගෝත්‍රික ප්‍රදේශවල (එෆ්ඒටීඒ) පෂ්තුන් ඉස්ලාමීය ව්‍යාපාර, පකිස්තානය හරහා වැටී ඇති එක්සත් ජනපදයේ සහ නැටෝවේ සැපයුම් මාර්ග අවහිර කිරීම ඇතුලුව, ඇෆ්ගනිස්තානය තුල සිටින ඇමරිකානු-නීත හමුදාවන්ට එරෙහිව පෂ්තුන් ගෝත්‍රික ජනයා මත පදනම් වූ තලිබාන් ව්‍යාපාරය දියත් කර ඇති ප්‍රතිරෝධයට සහයෝගය දක්වා තිබේ.

වොෂින්ටනයේ බලකිරීම මත ජනාධිපති අසිෆ් අලි සර්දාරි සහ අගමැති යුසුෆ් රාසා ගිලානිගේ පකිස්තාන ආන්ඩුව සටන්කාමීන් මර්දනය සඳහා මෙහෙයුම් අරඹන ලෙස මිලිටරියට නියෝග කර ඇත. අප්‍රේල් මාසයේ පසුභාගයේ උතුරුදිගට වන්නට පිහිටි ස්වැට් මිටියාවත් සිය බලප්‍රදේශ තුල සිට වයඹදිග දේශසීමා ප්‍රදේශයේ ලෝවර් ඩිර් සහ බුනර් දිස්ත්‍රික්කවලට පැමින සිටි කුඩා කන්ඩායමක් එලවා දැමීමට පකිස්තාන හමුදා එම දිස්ත්‍රික්ක තුලට මෙහෙයුම් දියත් කලහ.

මේ වනවිට 18,000ක් පමන වන පකිස්තාන හට පිරිසක් යොදවා ඇති මෙහෙයුම මැයි 8 දා පටන් ගුවන් සහ බර කාලතුවක්කු ද සහිතව ස්වැට් මිටියාවත් අභ්‍යන්තරයට ව්‍යාප්ත කර ඇත. පසුගිය දෙසතිය පුරා ඔවුන් සංඛ්‍යාවෙන් සහ ආයුධ ශක්තියෙන් බෙහෙවින් හීන වී සිටින ඉස්ලාමීය සටන්කරුවන්ට එරෙහිව ගැටුම් ගනනාවක නිරත වී තිබේ.

ගැටුම් පවතින ප්‍රදේශයෙන් තථ්‍ය වසයෙන් ම ස්වාධීන වාර්තාකරනයක් සිදුවන්නේ නැත. ස්වැට් ප්‍රදේශයෙන් එන බොහෝ තොරතුරු ගලා එන්නේ මිලිටරිය හරහා ය. ඒවායේ නිරවද්‍යභාවය ප්‍රශ්නයට බඳුන් වී ඇත.

එහෙත් පැහැදිලි කාරනය වන්නේ බුනර්, ලෝවර් ඩිර් සහ ස්වැට් මිටියාවත් ප්‍රදේශවලට එල්ල වන ප්‍රහාරය සමස්ත පෂ්තුන් ප්‍රජාවන්ට ම එරෙහි ම්ලේච්ඡ සාමූහික දඬුවමක් බවට පිරිහී ගොස් ඇති බවයි. සටන් පවතින ප්‍රදේශවලින් පිටවීම සඳහා භීතියට පත් ලක්ෂ සංඛ්‍යාත සිවිල් වැසියෝ මාර්ගවලට පැමින සිටිති. මේ සතිය ආරම්භයේ දී එක්සත් ජාතීන්, මිලියන 1.45ක පමන අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන් සංඛ්‍යාවක් ලියා පදිංචි කර තිබේ.

හුදෙක් මෙම දිස්ත්‍රික්ක තුනෙන් පමනක් පිටව ගොස් ඇති සංඛ්‍යාව ගත්කල එය 1947 දී බ්‍රිතාන්‍ය පාලනයට යටත් කලාපය ඉන්දියාව සහ පකිස්තානය ලෙස බෙදීමෙන් මෙපිට ඉන්දු උප-මහාද්වීපය තුල සිදු වූ දැවැන්ත ම වාර්ගික පවිත්‍රකරනය යි. ප්‍රමානවත් තරම් ආහාර, ජලය සහ සනීපාරක්ෂාව නොමැතිව ලක්ෂ ගනනක් ජනතාව ජරාජීර්න සරනාගත කඳවුරු තුලට රොක් වී ඇත. වසරේ පසුභාගයේ දරුනු ආහාර හිඟයකට සහ මන්දපෝෂනයට මගපාදමින් ගොවි ජනයාට ඔවුන්ගේ අස්වැන්න නෙලීමට නියමිත කාලයේ ම පලායාමට බලකෙරී ඇත.

මහජනයා ඉවත්වීයාමට එක් හේතුවක් වන්නේ පසුගිය වසරේ දී තදාසන්න ගෝත්‍රික ප්‍රදේශ වන බජාවුර් සහ මොහමන්ඩ්වලට එරෙහිව පකිස්තාන මිලිටරිය දියත් කල ප්‍රහාරයේ දී ප්‍රදර්ශනය කල රුදුරු ම්ලේච්ඡ ස්වභාවය යි. තලිබාන් සටන්කාමීන් පලවාහැරීම සඳහා ලෝ සෑම් යන ප්‍රධාන නගරය ද ඇතුලු නගර සහ ගම්මාන ගනනාවක් ම සුන්බුන් බවට පත්කරනු ලැබිනි. 500,000කට වැඩි ජනතාවකට උන්හිටි තැන් අහිමි කර ඇති බව ආධාර කන්ඩායම් තක්සේරු කර ඇති අතර 1,500කට වැඩි සටන්කාමීන් සංඛ්‍යාවක් මරා දැමූ බව ආන්ඩුව කියයි. සිවිල් වැසියන්ගේ ජීවිත හානි පිලිබඳ තක්සේරුවක් නැත.

ස්වැට් මිටියාවත ජන ශූන්‍ය කිරීම එම ප්‍රදේශයේ ආන්ඩු විරෝධී ගරිල්ලන් සංහාරය කිරීම සඳහා මිලිටරියට හොඳ ම කොන්දේසි නිර්මානය කිරීම අරමුනු කර ගත් දැනුවත් පිලිවෙතකි.

මාධ්‍ය වාර්තා පෙන්වා දෙන්නේ හැකිතාක් සටන්කාමීන් කොටුකරගැනීම සඳහා මින්ගෝරා නම් මධ්‍යම ස්වැට් නගරයේ පෙරමුනු තුනක ප්‍රහාරයක් දියත් කරනු ලැබ ඇති බවය. හමුදා සේනාංක බුනර් සහ ලෝවර් ඩිර් හරහා ඉදිරියට ගමන් කරමින් දකුනු ප්‍රදේශයෙන් ස්වැට් වෙත ඇතුලු වූහ. තවත් සේනාංකයක් උතුරුදිගින් ස්වැට් වෙත ලඟාවෙමින් සිටින අතර බටහිරදිග පෙයෝචාර් මිටියාවතෙන් ඉස්ලාමීය සටන්කරුවන් පලවා හැරීම සඳහා විශේෂ හමුදා සේනාංක යොදනු ලැබ තිබෙන අතර ය. බිනි බබා සියරට් නම් කඳුවැටියේ බලය සඳහා දෙසතියක් පුරා පැවති එක් ලේවැකි සටනක දී අවුරුදු 14ට නො වැඩි ලමයින් ද ඇතුලු 150ක් පමන තලිබාන් භටයන් ගනනක් මරා දමනු ලැබී යයි මිලිටරිය කියයි.

ලැබෙන තොරතුරු අපැහැදිලිය. ස්වැට් නගර ගනනාවක් මෙන් ම මින්ගෝරා නගරය බාහිර ලෝකය සමග සම්බන්ධ කරන මූලෝපායකට වැදගත් පාලම් සහ මාර්ගවල පාලනය අල්ලා ගැනීම සඳහා මිලිටරිය දැවැන්ත සටන් දියත් කොට ඇත. සොල්දාදුවන් 60 ගනනක ජීවිත බිලිදීමෙන් පසුව තමන් 1,100කට වැඩි සටන්කාමීන් ගනනක් මරා දැමී යයි මිලිටරිය මේ වන විට කියා සිටියි. මෑත දිනවල මින්ගෝරාවට යාබද කන්ජු නගරයේ දී හමුදාව වීදිසටන් වලට අවතීර්න වී සිටියි.

මැයි 16 දා අල් ජසීරා ප්‍රවෘත්ති සේවයේ වීඩියෝ පටියක මින්ගෝරා අසල දී සන්නද්ධ හෙලිකොප්ටර් මහාමාර්ගවලට බෝම්බ හෙලන ආකාරය පෙන්නුම් කලේය. නිවෙස් අසල සෙල්ලම් කරමින් සිටින ලමුන්, සටන්කාමීන් විසින් මාර්ග මත තබා දුරස්ත පාලක මගින් කල පිපිරවීම් මගින් ඇතිවූ වලවල් ඉන් පෙන්නුම් කලේ ය.

මින්ගෝරාහි පවතින තත්ත්වය සිහියට නංවන්නේ, 2004 නොවැම්බර් මාසයේ ෆලූජා නම් ඉරාක නගරය විනාශ කිරීම සහ දහස් ගනනකට මරු කැඳවූ එක්සත් ජනපදයේ මිනීමරු ප්‍රහාරයයි.

කලින් මින්ගෝරාහි ජනගහනය 250,000ක් පමන විය. හියුමන් රයිට්ස් වොච් වාර්තා කරන පරිදි දැන් ඉතිරිව ඇත්තේ 10,000 ක් තරම් අඩු ගනනකි. පකිස්තාන ආන්ඩුව ද ඊට සමාන තක්සේරුවක් ඉදිරිපත් කර ඇතත් ඒ අතර ම ඉතිරිව සිටින සියල්ලන් "තලිබාන් ආධාරකරුවන්" ලෙස ප්‍රකාශ කොට ඇත්තේ සංහාරයක් කල්තබා සාධාරනීකරනය කිරීම සඳහා ය.

ප්‍රහාරය පටන්ගත් තැන් පටන් මින්ගෝරාහි විදුලි බලය නොමැති බවත් රෝහල් සහ සෞඛ්‍ය පහසුකම් ක්‍රියාත්මක නො වන බවත් හියුමන් රයිට්ස් වොච් වාර්තා කලේ ය. දැන් හමුදාව ආහාර සැපයුම් කපාහරිමින් සිටී. බර ආයුධ සුලු ප්‍රමානයක් පමනක් සහිතව එහි සිටින සටන්කරුවන් කිහිප දහසක් නගරය ආරක්ෂා කිරීමේ නිරත වන අතර ඔවුන් වෙත ගුවන් ප්‍රහාර සහ කාලතුවක්කු ප්‍රහාර නිරන්තරයෙන් එල්ල කෙරේ.

මිලිටරියේ අරමුනු ප්‍රකාශයට පත්කරමින් මේජර් ජනරාල් සාජාඩ් ගානි ඇසෝෂියේටඩ් ප්‍රෙස් වෙත මෙසේ පැවසීයඃ "තොන්ඩුව ඔවුන් වටා තදවෙමින් තිබෙනවා. ඔවුන්ට පැනයාමට ඇති මාර්ග වසා දමා තිබෙනවා. ඔවුන් විනාශ කිරීම කාලය පිලිබඳ ප්‍රශ්නයක් පමනයි."

ස්වැට් සටන්කාමියෝ ටෙහ්රික්-ඉ-නෆාස්-ඉ-ෂාරියා-ඉ-මොහොමඩ් (ටීඑන්එස්එම්) හෙවත් ඉස්ලාමීය නීතිය බලාත්මක කිරීම සඳහා වූ ව්‍යාපාරයේ අනුගාමිකයෝ ය. ටීඑන්එස්එම් සංවිධානයට ඇෆ්ගන් තලිබාන් ව්‍යාපාරය මෙන් ම බයිතුල්ලා මෙෂූඩ් නායකත්වය දෙන පකිස්තාන තලිබාන් ව්‍යාපාරය සමග ද දෘෂ්ටිවාදාත්මක සම්බන්ධකම් ඇතත් එය ප්‍රාදේශීය සංවිධානයකි. එය දිස්ත්‍රික්කය තුලින් සහයෝගය දිනා ගත්තේ ඇෆ්ගනිස්තානය ආක්‍රමනය කිරීමට එක්සත් ජනපදයට ඉස්ලාමාබාදය දෙන සහයෝගය සහ එක් කලක රටෙහි ප්‍රමුඛ සංචාරක ස්ථානයක් සහ පකිස්තාන ධනවතුන්ගේ ක්‍රීඩාපිටියක්ව පැවති මෙම ප්‍රදේශයේ බොහෝ ජනයා මුහුන දෙන පෘථුල දරිද්‍රතාව යන දෙකට ම එරෙහි ප්‍රතික්‍රියාවක් වසයෙනි.

පූජකවරයෙක් වන සුෆි මොහොමඩ් සහ ඔහුගේ බෑනා වන මවුලානා ෆසුල්ලා යන ටීඑන්එස්එම් නායකයෝ ධනය යලි බෙදාහැරීමේ ඉල්ලීම් සහ දුප්පතුන් නොතකා හැරීම පිලිබඳව පකිස්තාන ආන්ඩුව හෙලාදැකීම වැනි ජනතාවාදී ඉල්ලීම් සමග ඉස්ලාමීය දේශනා ඒකාබද්ධ කිරීමට එෆ්එම් ගුවන් විදුලි ජාලයක් භාවිතා කලහ. වසර ගනනක සටන්වලින් පසුව පෙබරවාරි මාසයේ පකිස්තාන ආන්ඩුව ටීඑන්එස්එම් සමග සටන් විරාමයකට එලැඹුනේ ස්වැට් මිටියාවතේ ඉස්ලාමීය නීතියේ සංස්කරනය බලාත්මක කලහැකි යයි එකඟ වෙමිනි.

පසුව එලඹි සති කිහිපයේ ඉස්ලාමාබාදයට කිලෝමීටර 100ක් පමනක් උතුරින් පිහිටි බුනර් දිස්ත්‍රික්කයට ද සිය අනසක පැතිරවීමට ටීඑන්එස්එම් උත්සාහ දැරී ය. පකිස්තාන ආන්ඩුව ''තලිබාන්වරුන්ට'' රටෙහි අගනුවරත් අල්ලාගැනීමට හැකිවන තරම් ශක්තිමත් වීමට ඉඩ ලබා දී ඇතැයි අතිශයෝක්තියෙන් කියා පෑමට ඔබාමා පරිපාලනයට සහ බටහිර

පුවත්පත්වලට මේ මගින් ඉඩ සැලසුනි. මෙම චෝදනාවේ අරමුන ඉස්ලාමීය බලපෑම කුඩුකර දැමීමට මිලිටරිය මුදාහැරීම සඳහා සර්දාරි සහ ගිලානි වෙත පීඩනය එල්ල කිරීම යි.

ටීඑන්එස්එම් විනාශ කිරීමට එල්ල කරන ප්‍රහාරය ඔබාමා පරිපාලනය වෙනුවෙන් ක්‍රියාවට දමන ප්‍රචන්ඩ මිලිටරි මෙහෙයුම් මාලාවක මුල් අදියර පමනක් බව ආන්ඩුව පැහැදිලි කර ඇත. ආර්ථික බිඳවැටීමක් වලක්වාගැනීමට තමන්ට අවශ්‍ය ජාත්‍යන්තර මූල්‍ය සහාය නොලැබී යනු ඇතැයි පකිස්තාන පාලක ප්‍රභූව බියට පත්ව සිටී. මේ වනවිට පකිස්තාන රාජ්‍යය පවත්වාගෙන යනු ලබන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නයවලින් සහ එක්සත් ජනපදය හා ජපානය මගින් ලබාදෙන ආධාරවලිනි.

බ්‍රිතාන්‍ය *සන්ඩේ ටයිම්ස්* වෙත සර්දාරි මැයි 17 දා මෙසේ කීවේයඃ "හමුදා මෙහෙයුම් වසිරිස්තාන් ඇතුලු සියලු ප්‍රදේශ තුලට ගෙන යාමට අපි අදහස් කරමු. ස්වැට් එහි ආරම්භය පමනයි. එය ඉතා විශාල යුද්ධයක්." ඔහු ඩොලර් බිලියනයක හදිසි ආධාර ද ඉල්ලා සිටියේ ය. මේ දක්වා එක්සත් ජනපදය සහ අනෙකුත් බලවතුන් එකඟ වී ඇත්තේ ඩොලර් මිලියන 224ක් ලබාදීමට පමනි.

උතුරු සහ දකුනු වසිරිස්තානයේ තලිබාන් බලකොටු ඇෆ්ගනිස්තානය තුල සටන් කරමින් සිටින එක්සත් ජනපද හමුදාවක් සඳහා ආක්‍රමනික මූලෝපායිකව අතිශයින් වැදගත්ය. මුලුමනින් ම පාහේ පකිස්තාන ආන්ඩුවේ පාලනයෙන් පිටස්තරව පවතින මෙමගෝත්‍රික ප්‍රදේශ ආරක්ෂිත ස්ථාන සහ සැපයුම් ස්ථාන ලෙස ඇෆ්ගන් සටන්කාමීන් විසින් භාවිතා කරනු ලබන බව ප්‍රකට ය.

දුර සිට පාලනය කරන ස්වයංක්‍රිය ප්‍රහාරක යානා භාවිතා කරමින් එක්සත් ජනපද මිලිටරිය වසිරිස්තානය තුල ඉලක්ක වෙතට යලි යලිත් පහර දී තිබේ. ජාත්‍යන්තර නීතිය යටතේ නීතිවිරෝධී වන මෙම ප්‍රහාර, 700කට අධික සිවිල් වැසියන් සංඛ්‍යාවක් මරා දමා ඇතත් තලිබාන් නායකයන් යයි සැකකෙරෙන්නවුන් මිය ගොස් ඇත්තේ අතලොස්සක් පමනක් වන අතර මිලිටරි වාඩිලාගැනීමට විරුද්ධව සටන්කාමීන් දේශසීමා හරහා සිදුකරන ගමන් බිමන් කෙරෙහි ඉන් ඇති කර තිබෙන්නේ අල්ප බලපෑමකි.

වසිරිස්තානය මත ගොඩබිමින් එල්ල කරන ප්‍රහාරයන් බයිතුල්ලා මෙෂුඩ් සහ ඇෆ්ගන් හක්කානි ජාලයට පක්ෂපාතී විශාල පෂ්තුන් ගෝත්‍ර හමුදාවන්ට එරෙහිව පකිස්තාන මිලිටරිය එල්ල කරන ප්‍රහාරයක් ලෙස පැහැදිලි වී තිබේ. 2001 වසරේ සිදු වූ ඇෆ්ගනිස්තාන ආක්‍රමනයෙන් පසු කලින් කල ඇති වූ ගැටුම් වලින් 1,000කට අධික හමුදා භටයන්ගේ ද සටන්කාමීන් නො දන්නා ප්‍රමානයකගේ ද ජීවිත බිලිගෙන තිබේ.

ප්‍රහාරයේ තර්ජනයට පකිස්තාන තලිබානුවන් ප්‍රතිචාර දක්වා ඇත්තේ දකුනු වසිරිස්තානයෙන් හමුදා භටයන් ඉවත් කරගැනීම, ස්වයංක්‍රීය ප්‍රහාරක යානා මගින් සිදු කරන ගුවන් ප්‍රහාර අත්හිටුවීම සහ ඇතුල්වන සහ පිටවන රථවාහන පරීක්ෂා කිරීම නැවැත්වීම සඳහා තමන් මැයි 25 දා තෙක් පකිස්තාන ආන්ඩුවට කල් ලබාදෙන බව පවසමිනි. අපේක්ෂිත මිලිටරි ප්‍රහාරය සඳහා ඉස්ලාමීය සටන්කාමින් ආරක්ෂිත ස්ථාන ශක්තිමත් කරමින් සිටින්නේ යයි මාධ්‍ය වාර්තාවල සඳහන් වේ.

ප්‍රහාරයක් පිලිබඳ භීතියෙන් සිවිල් ජනතාව තවත් විශාල ප්‍රමානයක් පලායෑම ආරම්භ කර ඇත. මෑත දින කිහිපය තුල පමනක් පෂ්තුන් ගෝත්‍ර පවුල් දහස් ගනනක් වසිරිස්තානයට දකුනට වන්නට පිහිටි ටෑන්ක් වැනි වයඹදිග නගරවලට සරන පතා පැමින සිටිති. සිවිල් වැසියන් 200,000කට වැඩි ප්‍රමානයක් ගලා ඒ යයි අපේක්ෂාවෙන් එම ප්‍රදේශයට කූඩාරම් 5,000 ක් යවා ඇතැයි නිලධාරීන් පැවසූ බව මැයි 20 ඩෝන් පුවත්පත උපුටා දක්වයි.

© www.wsws.org